සියලු ම හිමිකම් ඇවිරිණි.

SRI LANKA

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර II විභාගය - 2024 ජූලි

## (204) ව්‍යාපාර කළමනාකරණය

(Business Management)

2024-08-11
පස්වරු
[01.45 – 05.00]

පිටු ගණන : 06
ප්‍රශ්න ගණන: 07

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(6) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 25)

### 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.5 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාළ අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** පහත සඳහන් ඒවා අතුරෙන්, කළමනාකරණ ක්‍රියාවලියේ ප්‍රධාන කාර්යයන් (main functions) තෝරන්න:

(1) සැළසුම්කරණය, තීරණ ගැනීම, සන්නිවේදනය සහ අභිප්‍රේරණය.

(2) සැළසුම්කරණය, සංවිධානකරණය, තීරණ ගැනීම සහ අලෙවිකරණය.

(3) සැළසුම්කරණය, සංවිධානකරණය, මෙහෙයවීම සහ පාලනය.

(4) සැළසුම්කරණය, අභිප්‍රේරණය, කාර්යක්ෂමතාව සහ පාලනය.

**1.2** පහත සඳහන් ප්‍රකාශ අතුරෙන්, සංවිධානයකට කළමනාකාරීත්වයේ අවශ්‍යතාවය සම්බන්ධයෙන් වන නිවැරදි ප්‍රකාශය වන්නේ කුමක් ද?

(1) සේවකයින්ට දිගු වේලාවක් වැඩ කිරීම තහවුරු කිරීම.

(2) ආයතනික අරමුණු කාර්යක්ෂමව හා සඵලදායිව ළඟා කර ගැනීම.

(3) සංවිධානයක සෑම කාර්යයක්ම කළමනාකරණය කිරීම.

(4) සේවකයින්ගේ ස්වාධිපත්‍ය අවම කිරීම.

**1.3** පහත සඳහන් ඒවා අතුරෙන්, "වෙනසෙහි අභ්‍යන්තර බලවේගයක්" සඳහා උදාහරණයක් වන්නේ කුමක් ද?

(1) වැඩ පරිසරයේ කොන්දේසි. (2) තරඟකරුවන්ගේ බලපෑම.

(3) සැපයුම්කරුවන්ගේ බලපෑම. (4) ඉහත සඳහන් සියල්ලම.

**1.4** පහත සඳහන් ප්‍රකාශ සළකා බලන්න:

**(a)** තීරණ ගැනීම, කළමනාකරණයේ අඛණ්ඩ ක්‍රියාවලියක් වේ.

**(b)** තීරණ ගැනීම, සමස්ත කළමනාකරණ ක්‍රියාවලියටම පහසුකම් සැපයීමට උදව් කරයි.

**(c)** සැලසුම්කරණය සහ තීරණ ගැනීම අතර සම්බන්ධතාවයක් නොමැත.

**(d)** ධූරාවලියේ මට්ටම්වල සියලුම කළමනාකරුවන්ට තීරණ ගැනීම අවශ්‍ය වේ.

ඉහත සඳහන් ඒවා අතුරෙන්, තීරණ ගැනීම සම්බන්ධයෙන් වන නිවැරදි ප්‍රකාශ වන්නේ:

(1) **(a)** සහ **(b)** පමණි. (2) **(a), (b)** සහ **(c)** පමණි.

(3) **(a), (b)** සහ **(d)** පමණි. (4) ඉහත සඳහන් සියල්ලම.

**1.5** සැලසුම්කරණය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ සළකා බලන්න:

**(a)** එය හැඟීම්වලට වඩා හේතු සාධක මත පදනම් වේ.

**(b)** එය ආයතනික පරමාර්ථ සහ අරමුණු පිහිටුවීමට උපකාරී වේ.

**(c)** එමඟින් වියවුල් සහ අවිනිශ්චිතතා වැඩි කරයි.

**(d)** එය මහා පරිමාණ සංවිධාන සඳහා පමණක් අදාළ වේ.

ඉහත සඳහන් ඒවා අතුරෙන්, සැලසුම්කරණය සම්බන්ධයෙන් වන නිවැරදි ප්‍රකාශ වන්නේ:

(1) **(a)** සහ **(b)** පමණි. (2) **(a)** සහ **(c)** පමණි.

(3) **(a)** සහ **(d)** පමණි. (4) **(a), (b)** සහ **(d)** පමණි.

(එකකට ලකුණු 02 බැගින්, ලකුණු 10)

*අංක 1.6 සිට 1.10 දක්වා ප්‍රශ්නවල හිස්තැන් පිරවීම සඳහා වරහන් තුල දී ඇති උත්තර දෙක අතුරින් නිවැරදි උත්තරය තෝරාගන්න. තෝරාගත් උත්තරය ප්‍රශ්න අංකය සමඟ, උත්තර පොතේ ලියන්න.*

**1.6** තාක්ෂණික, අන්තර් පුද්ගල සහ ............ *(සංකල්පනාත්මක / කලාත්මක)* කුසලතාවන්ගේ එකතුවකින් සඵලදායී කළමනාකරණ කුසලතාවයන් සමන්විත වේ.

**1.7** කළමනාකරණයේදී තීරණ ගැනීමට ඇතුලත් වන්නේ විකල්ප ගොඩනැගීම, ඒවා ඇගයීම, හොඳම විකල්පය තෝරාගැනීම සහ හොඳම විකල්පය ............ *(ක්‍රියාත්මක කිරීම / පැවරීම)* වේ.

**1.8** නායකයින් සහ කළමනාකරුවන් යන දෙපිරිසම වැදගත් භූමිකාවන් ඉටුකරන අතර, එම දෙදෙනා අතර, ප්‍රධාන වෙනසක් වන්නේ නායකයින් විසින් ............ *(දැක්ම / කාර්යයන්)* කෙරෙහි අවධානය යොමු කිරීම වේ.

**1.9** නූතන ව්‍යාපාර ආයතනයක සන්නිවේදනය තුලින් සහයෝගිතාවය, කණ්ඩායම් වැඩ ප්‍රවර්ධනය කිරීම සහ ආයතනයේ සියලු මට්ටම් අතර, ............ *(අපැහැදිලි / පැහැදිලි)* බව තහවුරු කිරීමේ පදනමක් ලෙස කටයුතු කරනු ලැබේ.

**1.10** පීටර් ඩකර් (Peter Ducker) ට අනුව නිවැරදි දේ කිරීම (doing the right thing) ............ *(සඵලදායීතාව / කාර්යක්ෂමතාව)* වේ.

(එකකට ලකුණු 01 බැගින්, ලකුණු 05)

*අංක 1.11 සිට 1.15 දක්වා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර, ප්‍රශ්න අංක ද සමඟ, ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.11** නූතන ව්‍යාපාරික පරිසරය තුළ කළමනාකරුවන් මුහුණ දෙන ප්‍රධාන අභියෝග දෙකක්(02) සඳහන් කරන්න.

**1.12** ඵලදායිතාවය (productivity) යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

**1.13** මූලික අලෙවිකරණ මිශ්‍රය (4Ps) හඳුනා දක්වන්න.

**1.14** වෙනස කළමනාකරණය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

**1.15** සේවකයින් විසින් වෙනසට ප්‍රතිරෝධය දැක්වීම සඳහා වන හේතු දෙකක්(02) සඳහන් කරන්න.

(එකකට ලකුණු 02 බැගින්, ලකුණු 10)
(මුළු ලකුණු 25)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 50)

### 02 වන ප්‍රශ්නය

ක්‍රියාකාරී සිල්ලර වෙළෙඳ සමාගමක, තීරණ ගැනීමේදී තොරතුරුවල කාර්යභාරය ඉතා වැදගත් වේ. මෙයට ඉල්ලුම් පුරෝකතනය කිරීම, ප්‍රවර්ධන කටයුතු පෙළගැස්ම සහ ප්‍රශස්ත තොගයක් පවත්වා ගැනීම ඇතුළත් වේ. දෙපාර්තමේන්තු අතර කටයුතු සුමටව සිදුවීම මගින් ආයතනික ව්‍යුහයේ වැදගත්කම පැහැදිලි වේ. තොරතුරු මත පදනම් වූ තීරණ ගැනීම, සූක්ෂම සැලසුම් කිරීම සහ ශක්තිමත් ආයතනික ව්‍යුහයන් පැවතීම මගින් සිල්ලර වෙළෙඳ සමාගමකට ගතික වෙළෙඳපොළ තුළ සාර්ථකත්වය ළඟාකර ගැනීමට මඟ පාදනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) සැලසුම්කරණය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න **සඳහන් කරන්න**. (ලකුණු 02)

(b) තීරණ ගැනීමේදී තොරතුරු වැදගත්වීමට හේතු තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(c) ආංශික ව්‍යුහයේ (divisional structure) ඇති වාසි දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)
(මුළු ලකුණු 10)

### 03 වන ප්‍රශ්නය

බැංකු සමාගමක් තුළ, අධිකාරිත්වය තුළින් තීරණ ගැනීමේ සහ ප්‍රතිපත්ති බලාත්මක කිරීමේ අයිතිය පුද්ගලයින්ට ලබාදෙමින් කළමනාකාරීත්ව භූමිකාවන්ට එය පවරනු ලැබේ. කර්මාන්තයන් නව තාක්ෂණය හා මුසුවන බැවින්, මූල්‍ය වෘත්තිකයින්ට විකාශනය වන නව තත්ත්වයන් හා මුසුවීමට අවශ්‍ය නිපුණත්වයන් තිබිය යුතුය. අති නවීන මූල්‍ය තාක්ෂණ පද්ධතියක් සාර්ථකව ක්‍රියාත්මක කිරීම සහතික කිරීම පිණිස සඵලදායි සන්නිවේදනය ඉතා වැදගත් වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) අධිකාරිත්වය (authority) සහ බලය (power) අතර වෙනස **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(b) නව තාක්ෂණය සමඟ මූල්‍ය කළමනාකරුවන් (finance managers) සඳහා අවශ්‍ය වන නිපුණතාවයන් (competencies) දෙකක්(02) **හඳුනා දක්වන්න**. (ලකුණු 02)

(c) අති නවීන මූල්‍ය තාක්ෂණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීමේදී සඵලදායි සන්නිවේදන ක්‍රියාවලියක් තිබීමේ වැදගත්කම් දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)
(මුළු ලකුණු 10)

## 04 වන ප්‍රශ්නය

සැපයුම් දාම කළමනාකරණය (Supply Chain Management) යනු මෙහෙයුම් කළමනාකරණයේ ප්‍රධාන කාර්යයක් වන අතර, සැපයුම්කරුවන්, නිෂ්පාදකයින් සහ බෙදාහරින්නන් අතර සමාගමට බාධාවකින් තොරව සම්බන්ධීකරණය ලඟාකර ගැනීම් මඟින් සැපයුම් දාම කළමනාකරණයේ වැදගත්කම පැහැදිලි වේ. නිවැරදි ආකාරයෙන් සැපයුම් දාම කළමනාකරණය කිරීම සඳහා සැපයුම් දාම මෙහෙයුම් සඳහා උපාය මාර්ග කීපයක් යොදා ගැනීමට ව්‍යාපාරයකට අවශ්‍ය වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) සැපයුම් දාම කළමනාකරණය හැරුණු විට මෙහෙයුම් කළමනාකරණයේ කාර්යයන් දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(b) සඵලදායි සැපයුම් දාම කළමනාකරණයේ වැදගත්කම් දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(c) භාණ්ඩ සහ සේවා අතර වෙනස්කම් දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 10)

## 05 වන ප්‍රශ්නය

වර්තමාන තත්ත්වය තුළ ශ්‍රම බලකායේ ඇති විවිධත්වය ආයතනික කළමනාකරුවන්ට විශාල අභියෝගයක් වී ඇත. විවිධ සේවකයින්ගේ ප්‍රශස්ත දායකත්වය ලබා ගනිමින් ආයතනයේ පොදු අරමුණු කරා ඔවුන්ව යොමුකිරීම ව්‍යාපාර ආයතනවල සිටින සෑම කළමනාකරුවෙකුගේම ඒකායන අරමුණ වී ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) සංවිධානයකට මානව සම්පත් කළමනාකරණය වැදගත්වීමට හේතු තුනක්(03) **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(b) සංවිධානයක් සඳහා සංවිධානාත්මක චර්යාවෙන් (organizational behavior) ලැබෙන ප්‍රතිලාභ හතරක්(04) **සඳහන් කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

තරඟකාරී මෝටර් රථ කර්මාන්තය තුළ, විවිධාංගීකරණ උපායමාර්ගය අනුගමනය කරනු ලබන සමාගමක් විසින් පරිසර හිතකාමී පාරිභෝගිකයින් ඉලක්ක කර ගනිමින් අති නවීන තාක්ෂණයෙන් යුත් පෙරළිකාර විද්‍යුත් මෝටර් රථයක් හඳුන්වා දී ඇත. සමාජ මාධ්‍ය හා සෙවුම් යන්ත්‍ර (search engines) යන ඩිජිටල් අලෙවිකරණ ක්‍රම හරහා සමාගම විසින් මෙම මෝටර් රථයේ ඇති උසස් විශේෂාංග, පාරිසරික ප්‍රතිලාභ සහ උසස් ක්‍රියාකාරීත්වය පිළිබඳ ඉස්මතු කරමින් වෙළෙඳපොළේ විශේෂිත වූ ස්ථානයක් නිර්මාණය කරමින් නවෝත්පාදන සහ තිරසරභාවය අපේක්ෂා කරන කුඩා ප්‍රේක්ෂක පිරිසක් ආකර්ෂණය කරගනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඛණ්ඩනය (segmentation) සහ ස්ථානගත කිරීම (positioning) අතර වෙනස **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(b) ව්‍යාපාරයකට ඩිජිටල් අලෙවිකරණයේ ඇති වාසි දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(c) විවිධාංගීකරණ උපායමාර්ගයක් (differentiation strategy) යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි යන්න **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 25)

### 07 වන ප්‍රශ්නය

**XYZ රටෙහි** ජාතික ගුවන් සේවය වන **පීකොක් එයාර්ලයින්ස්**, මෑත වර්ෂවලදී මූල්‍යමය පසු බෑම, මෙහෙයුම් අකාර්යක්ෂමතාව සහ ගුවන්සේවා කර්මාන්තයේ ගෝලීය තරඟකාරීත්වය ඇතුළුව සැලකිය යුතු අභියෝගයන්ට මුහුණ පාමින් සිටී. ගුවන් සේවාවේ අනාගත ගමන්මග ප්‍රතිනිර්මාණය කිරීමේදී උපාය මාර්ගික කළමනාකරණය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ලබයි. අභ්‍යන්තර හා බාහිර පරිසරය පිළිබඳ වූ විශ්ලේෂණයක් මඟින් පුළුල් උපාය මාර්ගික සැලැස්මක් නිර්මාණය කිරීමට මඟ පාදනු ලැබේ. ආයතනය විසින් පැහැදිලි අරමුණු පිහිටුවා ප්‍රධාන කාර්යසාධන දර්ශක හඳුනාගෙන, ශක්තිමත් අධීක්ෂණ සහ ඇගයීම් පද්ධතියක් ක්‍රියාත්මකකොට ඇත.

මෙම තීරණාත්මක අවධියේදී ගුවන් සමාගමේ නායකත්ව වෙනසකට භාජනය විය. මූල්‍ය කාර්යසාධනයේ පිරිහීමට මුහුණ දී, පරිවර්තනීය ගමනක් ආරම්භ කිරීමට නව ප්‍රධාන විධායක නිලධාරියාට සිදු විය. ආචාරශීලී නායකත්වය සහ වගවීම කෙරෙහි අවධාරණය, විශ්වාසය නැවත ගොඩනැගීමේදී සහ ශ්‍රම බලකාය පොදු අරමුණක් වෙත පෙළගැස්වීමේදී තීරණාත්මක කාර්යභාරයක් ඉටුකරන ලදී. මානව සම්පත් කළමනාකරණය මඟින් **පීකොක් එයාර්ලයින්ස්** ආයතනය තුළ ප්‍රධාන කාරයභාරයක් ඉටුකරන ලදී. සේවක නිපුණතා වැඩිදියුණු කිරීම සහ නවෝත්පාදනයන් වැඩිදියුණු කිරීම සඳහා පුහුණු සහ සංවර්ධන වැඩසටහන් නැවත දියත් කරන ලදී.

වැඩිවන තරඟකාරීත්වය හමුවේ **පීකොක් එයාර්ලයින්ස්** ආයතනයට සිය අලෙවිකරණ උපායමාර්ග නැවත සකස් කිරීමට සිදුවිය. අලෙවිකරණ කණ්ඩායම මගී අවශ්‍යතාවයන් සහ මගීන්ගේ අභිරුචිය අවබෝධ කරගැනීම පිණිස වෙළෙඳපොළ සමීක්ෂණ වේගවත් කරමින් පාරිභෝගිකයින් කේන්ද්‍ර කරගනිමින් ප්‍රවේශයක් අනුගමනය කරනු ලැබේ. ගුවන් සමාගම විශ්වාසවන්ත සහ ඉහළ සතයේ සේවය සපයන්නෙකු ලෙස ස්ථානගත කිරීම සඳහා සන්නාමකරණය තීව්‍ර කරන ලදී. ගුවන් සමාගමේ ප්‍රවේශය පුළුල් කිරීම සඳහා ගෝලීය ආයතන සමඟ උපක්‍රමික හවුල්කාරිත්වයක් ඇති කර ගැනීම සහ ඩිජිටල් අලෙවිකරණ ක්‍රම ක්‍රියාවට නංවන ලදී. අලෙවිකරණ කළමනාකරණ කණ්ඩායම විසින් ගුවන් සමාගමේ ප්‍රතිරූපය සාර්ථක ලෙස නැවත අර්ථගන්වා ඇති අතර, විවිධ වූ පාරිභෝගික කණ්ඩායම් ආකර්ශනය කර ගනිමින් වෙළෙඳපොළ කොටස වැඩිදියුණුකොට ඇත. **පීකොක් එයාර්ලයින්ස්** හි සන්නිවේදනය ඉතා වැදගත් අංගයක් වන අතර, සේවකයින් දැනුවත් කිරීම සහ ඔවුන් වැඩවල යොමු කිරීම සඳහා නිතිපතා රැස්වීම්, වැඩමුළු සහ පුහුණු සැසිවාර ක්‍රියාත්මක කරනු ලැබේ. අනුවර්තනය සහ ඔරොත්තු දීමේ පරිසරයක් ගොඩනැගීම, ගුවන්සේවා කර්මාන්තයේ සිදුවන නව විකාශනයන් සඳහා සේවකයින් සූදානම් කිරීමේ කටයුතු කෙරෙහි වෙනස කළමනාකරණ උපායමාර්ග මඟින් අවධානය යොමු කරනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **පීකොක් එයාර්ලයින්ස්** සඳහා සඵලදායි නායකත්වයක් වැදගත් වන්නේ ඇයිදැයි යන්නට හේතු තුනක්(03) **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(b) නවීකරණය කරන ලද පුහුණු හා සංවර්ධන වැඩසටහන්, සේවක නිපුණතා වැඩිදියුණු කිරීමට සහ නවෝත්පාදනයන් වර්ධනය කිරීමට දායකවන ආකාර තුනක්(03) **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(c) විවිධ වූ පාරිභෝගික කණ්ඩායම් ආකර්ෂණය කරගැනීම සඳහා එහි සන්නාමය නැවත ස්ථානගත කිරීම (repositioning) තුළින් **පීකොක් එයාර්ලයින්ස්** වෙත ලැබෙන ප්‍රතිලාභ (benefits) තුනක්(03) **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(d) **පීකොක් එයාර්ලයින්ස්** හි උපායමාර්ගික සැලසුම්කරණ ක්‍රියාවලිය සඳහා පාරිසරික විශ්ලේෂණය (environmental analysis) වැදගත් වන්නේ ඇයිද යන්න **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(e) **පීකොක් එයාර්ලයින්ස්** හි විවිධ කළමනාකරණ මට්ටම් සඳහා ගොඩනගා ඇති ප්‍රධාන උපායමාර්ග තුනක්(03) **හඳුනා දක්වන්න.** (ලකුණු 03)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | අඳින්න | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | සඳහන් කරන්න | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | හඳුනා දක්වන්න | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | හඳුනාගන්න | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | අර්ථකතනය කරන්න | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | විස්තර කරන්න | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | පැහැදිලි කරන්න | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැළපීම. | සසඳන්න | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | ප්‍රස්තාර දක්වන්න | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | විසඳන්න | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | පිළියෙල කරන්න | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | ප්‍රදර්ශනය කරන්න | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | භාවිත කරන්න | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | සන්නිවේදනය කරන්න | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | සමානකම් බලන්න | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | විමසන්න | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |